කොත්මලේ ප්‍රාදේශීය සභාව - 2013

නුවරඑළිය දිස්ත්‍රික්කය

-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 21 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය ව්‍යාවනය

----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකිවිය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------

ප්‍රදේශීය සභාව සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙලකර ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,281,416ක් වූ ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.587,333ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් රු.694,083ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,838,427ක් වූ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.5,844,022ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් රු.5,595ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,864,606ක් වූ ණයහිමි ශේෂය රු.11,964,606ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වගකීම් රු.100,000ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.77,211,643ක් වූ සමුච්චිත අරමුදලේ හා සංචිතවල වටිනාකම රු.79,498,900ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා සංචිත රු.2,287,257ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ). 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී අනාවරණය කරන ලද ගණකාධිකරණ අඩුපාඩු සමාලෝචිත වර්ෂය තුළදී ද නිවැරදි කර නොතිබූ අතර, මූල්‍ය ප්‍රකාශනවලට එහි බලපෑම තවදුරටත් පැවතුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්.

-----------------------------

ගිණුම් විෂයයන් 04 ක උපයෝගී ලේඛන අනුව ශේෂය හා පාලන ගිණුම් අනුව ශේෂය අතර රු.50,005ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු ගිණුම්

-------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.17,091,403ක් වූ අතර ඒ තුළ වූ අවුරුදු 01ක කාලයක් ඉක්මවූ ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.1,626,261ක් විය.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

2013 දෙසැම්බර් 31 දිනට අවු:01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම රු.527,494ක් වී තිබුණි.

1.3.6 අවිනිශ්චිත ගිණුම

-------------------

2013 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය රු.2,400,849ක් වූ අතර එම ශේෂයට පාදක වූ හේතු පරීක්ෂාකර බලා නිරවුල් කිරීමට විගණන දිනවූ 2014 ජුනි 08 වන විටත් කටයුතු කර නොතිබුණි.

1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

(අ) විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරීම

---------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.68,482,051ක් වූ ගනුදෙනු විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

(ආ) පිළිතුරු නොලත් විගණන විමසුම්

------------------------------------

2014 ජුනි 30 දින වන විට විගණන විමසුම් 02ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

1.3.8 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

-----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.6 වගන්තිය | සභාවේ සේවයේ යෙදී සිට මියගොස් ඇති හා විස්තර හඳුනා ගත නොහැකි සේවකයන් 21 දෙනෙකුගෙන් අයවිය යුතුව පවතින රු.28,952ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ). | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය හා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල බෙදාහැරීම. | ප්‍රාදේශීය සභාවල කාර්යාල සේවකයින්ගේ පත්වීම බලධාරියා සභාවේ ලේකම්වරයා වුවත් සභාපතිවරයා විසින් සේවකයින් 07 දෙනෙකු සඳහා පත්වීම් ලබාදී රු.894,753ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,212,681ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,536,147ක් වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
------------------------------------

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය හා සමඟ සැසඳීමේදී රු.323,466ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2013 වර්ෂයේදී ආදායම් විෂයයන් 03ක ආදායම සියයට 2 සිට සියයට 13 පරාසයකින් අඩුවීමත් වියදම් විෂයයන් 04ක වියදම සියයට 05 සිට සියයට 115 දක්වා වූ පරාසයකින් වැඩිවීමක් හේතුවී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.
------------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| I. | වරිපනම් හා බදු. | 4,219 | 2,757 | 1,462 |
| II. | බදු කුලී. | 1,397 | 619 | 778 |
| III. | බලපත්‍ර ගාස්තු | 2,661 | 2,661 | - |
| IV. | වෙනත් ආදායම්. | 1,389 | 1,080 | 309 |

2.3.2 කුලී රථ නවතා තැබීමේ ගාස්තු
---------------------------------

ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව අඩු සැලකිල්ලක් දැක්වීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දින වන විට කුලී රථ නවතා තැබීමේ ගාස්තු රු.532,100ක් හිඟව පැවතුණි.

2.3.3 බලපත්‍ර ගාස්තු
-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි හොටල්වල බලපත්‍ර ගාස්තුව ඉකුත් වර්ෂයේ ලැබීම්වලින් සියයට 1 ක් ලෙස

අයකළ යුතු වුවද, සභා බලප්‍රදේශයේ හෝටල් දෙකකින් ලැබීම් වලින් සියයට 1 ක් අයකරනු වෙනුවට රු.3,000ක බලපත්‍ර ගාස්තුවක් අයකරමින් පැවතුණි.

2.3.4 මස්කඩ කුලී

-------------

1986 වර්ෂයේ සිට හිඟ මස්කඩ කුලී වශයෙන් එම්.එම්.අලී මයාගෙන් ලැබිය යුතු රු.78,500ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 දූරකථන සම්ප්‍රේෂණ කුළුණු

-----------------------------

සභා බලප්‍රදේශය තුළ අනුමැතියක් රහිතව ඉදිකර තිබූ දූරකථන සම්ප්‍රේෂණ කුළුණු 06ක් සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර ඒ මගින් අයවිය යුතු විශාල ආදායමක්ද අහිමිවී තිබුණි.

2.3.6 විදුලි ව්‍යාපෘති

---------------

ප්‍රාදේශීය සභා සීමාව තුළ ක්‍රියාත්මක කුඩා ප්‍රමාණයේ විදුලි ව්‍යාපෘති 03ක් සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

සමාලෝචිත වර්ෂය අවසාන වන විට මධ්‍යම පළාත් සභාවෙන් උසාවි දඩ රු.587,333 ක් හා රු.5,844,022 ක මුද්දර ගාස්තු අයවිය යුතුව පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම

----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යපාටියට සිදුවී තිබේද යන්න තහවුරු කරගැනීම සඳහා පිළියෙල කර තිබූ පාලන වාර්තා මගින් භෞතික හා මූල්‍ය කාර්යය සාධනය සංසන්දනය කිරීමට නොහැකි විය. විගණනයට ඉදිරිපත් කර තිබුණු පාලන වාර්තා මගින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක මූල්‍ය කාර්ය සාධනය පරීක්ෂා කල හැකි ලෙස ප්‍රමාණවත් පරිදි ඉලක්ක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

-----------------------------------

(අ). ප්‍රාදේශී සභා බලප්‍රදේශය තුළ 2013 වර්ෂය තුළදී අනවසර ඉදිකිරීම් 85ක් සිදුකර තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ). ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ 2013 වර්ෂයේ ඉඩම් වෙන්දේසි ආයතන මගින් ඉඩම් කොටස් දෙකක් සභා අනුමැතියක් රහිතව කොටස්කර විකුණමින් පැවති අතර ප්‍රාදේශීය සභාව ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

i. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පූඩළුඔය නගරයේ රු.32,675,105ක වියදමින් ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ වැඩ 2011 නොවැම්බර් 02 දින අවසන් කර භාරගෙන වසර 02ක කාලයක් ඉක්ම ගොස් ඇතත් ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි.

ii. අංක J.D 4866 දරන නිසාන් කැරවන් වර්ගයේ ගිලන් රථය 2010 වර්ෂයේ සිට වසර 04කට අධික කාලයක් ධාවනයෙන් ඉවත්කර කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------
ප්‍රාදේශීය සභාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර, පරිසරයට හානිකර පරිදි කසළ බැහැර කරමින් පැවතුණි.

3.5 අධිභාර
--------
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂය තුළ පනවන ලද අධිභාර අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු.127,525ක මුදලක් අයකර ගැනීමට පැවතුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-----------------------------------------
4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------
සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

4.2 අයවැය පාලනය.
--------------------
සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 06ක සියයට 16 සිට සියයට 72 දක්වාද වියදම් විෂයයන් 07ක සියයට 05සිට සියයට 748 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.3 අභ්‍යන්තර විගණනය
-----------------------
ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන.
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.
(ආ). අභ්‍යන්තර පාලනය
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). ණයගැති ණයහිමි පාලනය.
(ඉ). වත්කම් කළමනාකරණය